සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
First Term Test, March 2019

11 ශ්‍රේණිය
Grade 11

# ඉතිහාසය - I

පැය එකයි
One hour

සැලකිය යුතුයි :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමිවේ.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. මහා වංශය අපගේ අඛණ්ඩ ඉතිහාසය පිළිබඳ තොරතුරු ලබා ගත හැකි ඉතා වටිනා මූලාශ්‍රයකි. එහි මුල් කොටස රචනා කරන ලද්දේ,
(1) බුද්ධඝෝෂ හිමියන් විසින් ය. (2) ධර්මකීර්ති හිමියන් විසින් ය.
(3) මහානාම හිමියන් විසින් ය. (4) පාහියන් හිමියන් විසින් ය.

02. තෙත් කලාපීය එළිමහන් කඳවුරකට නිදසුනක් වන්නේ,
(1) පාහියන්ගල (2) හෝර්ටන්තැන්න
(3) මිනිහාගල්කන්ද (4) බෙල්ලන්බැඳි පැලැස්ස

03. තම රටේ ඉතිහාසය පිළිබඳ දැනුවත් වීමෙන් ලැබිය හැකි වැදගත්කම ප්‍රයෝජනය වන්නේ,
(1) අතීතයේ සිදුවූ දේවල් නැවත මතක්කර සතුටුවීමයි.
(2) විදේශ කුමන්ත්‍රණවලින් ආරක්ෂාවීම සඳහායි.
(3) අතීතයේ ඇතිවූ විවිධ අභියෝග හඳුනාගෙන අනාගතය සකස් කර ගැනීමටයි.
(4) අතීතයේ සිදුවූ අමිහිරි අත්දැකීම් නැවත සිදුනොවීමට වගබලා ගැනීමටයි.

04. පූර්ව ඓතිහාසික යුගයේ මැටි ඔරු සුසාන භූමියක් තිබූ ස්ථානයක් ලෙස හඳුනාගත හැකි වන්නේ,
(1) අලිගල (2) බටදොඹ ලෙන (3) බූන්දල (4) රංචාමඩම

05. පැරණි කාසි පිළිබඳ හදාරන විද්‍යාව හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?
(1) වාස්තු විද්‍යාව (2) නාණක විද්‍යාව (3) පුරා විද්‍යාව (4) මානව විද්‍යාව

06. ඉන්ඩිකා නම් විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය රචනා කර ඇත්තේ,
(1) මෙගස්තීනිස් (2) කොස්මස් (3) අබුසයිද් (4) ප්‍රකෝපියස්

07. වසභ රජුගේ පාලනය ලංකාවේ උතුරු ප්‍රදේශය දක්වා පැතිර තිබූ බව සඳහන් වන මූලාශ්‍රය කුමක් ද?
(1) පනාකඩුව තඹ සන්නස (2) ගල්පොත ශිලා ලිපිය
(3) අඹගමුව සෙල්ලිපිය (4) වල්ලිපුරම් රන් සන්නස

08. වැටකින් ආවරණය වූ ගමක් හැඳින්වීමට අතීතයේදී භාවිතා කළේ කුමන නමක් ද?
(1) පරිබිත්ත ගම් (2) අපරිබිත්ත ගම් (3) ඔලගම් (4) නියම් ගම්

09. ගංගා කිහිපයක් හැඳින්වූ පැරණි නම් හා අලුත් නම් "අ" හා "ආ" තීරුවල දක්වේ. සුදුසු පරිදි ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' | | 'ආ' | |
|---|---|---|---|
| 1. | කදම්බ නදී | A | දැදුරුඔය |
| 2. | ගෝණනදී | B | මහවැලි ගඟ |
| 3. | මහාවාලුකා නදී | C | මල්වතු ඔය |
| 4. | ජජ්ජර නදී | D | කලාඔය |

(1) CBDA (2) CDBA (3) BACD (4) ACDB

10. පූර්ව ඓතිහාසික යුගය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) භාවිතය සඳහා ක්ෂුද්‍ර ගල් මෙවලම් සකස් කර ගැනීම ආරම්භ කළහ.
(2) වළ දැමූ ඇට සැකිලි ගොඩගෙන රතු පැහැති ගුරුගල් ආලේප කළහ.
(3) ගොළුබෙල්ලන් ආහාරයට ගැනීමට මහත් රුචියක් දැක්වූහ.
(4) පිළිස්සූ මැටි වළං භාවිතය ආරම්භ කළහ.

11. අතීතයේදී එක් එක් වෘත්තිකයන් විසූ ජනාවාස පිළිබඳ වංශ කථාවලින් තොරතුරු හෙළිවේ. පහත 'අ' හා 'ආ' තීරු සුදුසු පරිදි ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. කේවට්ටගාම | A මැණික් ගැරූ අය විසූ ගම් |
| 2. වඩ්ඩකීගාම | B ගොවීන් විසූ ගම් |
| 3. මණිකාරගාම | C ධීවරයන් විසූ ගම් |
| 4. කසිකාරගාම | D වඩුවන් විසූ ගම් |

(1) CDAB (2) CBAD (3) CADB (4) BCDA

12. ගෘහපතීන් කිහිපදෙනෙකුගෙන් සැදුම්ලත් කණ්ඩායමක් වෙනුවෙන් කටයුතු කළ පුද්ගලයා හැඳින්වූයේ කුමන නමකින් ද?
(1) ගහපති (2) ගමික (3) පරුමක (4) රජු

13. විහාරස්ථානයේ දානය සපයා ගැනීමේ කටයුතුවලදී යම් ගැටලුවක් ඇතිවුවහොත් දසගම් ඇත්තන් රැස්වී එම ගැටලුව විසඳිය යුතු බවට සඳහන් සෙල්ලිපිය වන්නේ,
(1) තෝනිගල (2) බඹරගස්තලාව (3) කළුදියපොකුණ (4) හෝපිටිගමුව

14. වැව් අමුණු තනවා ආර්ථිකයට කළ සේවාව නිසා දේවත්වයට පත්ව ඇති රජතුමා වන්නේ,
(1) කුටකණ්ණ අභය (2) මහසෙන් (3) ධාතුසේන (4) I අග්බෝ රජතුමාය

15. අතීත දේශපාලන බලය මධ්‍යගතවීමෙන් පසුව ගොඩ නැගුණු රාජ්‍ය පරිපාලන සැකැස්මේ ඉහළම තනතුර වූයේ,
(1) මහමත (2) පරුමක (3) ශෙනපති (4) මපුරුමුකා

16. IV වන උදය රජතුමා විසින් කරවන ලද බදුලු ටැම් ලිපියේ විශේෂත්වය වන්නේ,
(1) වෙළඳපොළක පාලනය පිළිබඳ තොරතුරු ඇතුළත් වීම.
(2) පැරණි දඬුවම් පිළිබඳ තොරතුරු ඇතුළත් වීම.
(3) විනය නීති පිළිබඳ තොරතුරු ඇතුළත් වීම.
(4) ගොවිතැන් කරන කන්න පිළිබඳ තොරතුරු ඇතුළත් වීම.

17. පැරණි බෞද්ධ ආරාමවල ''අන්තේවාසික'' භික්ෂූන් ලෙස හැඳින්වූයේ කුමන භික්ෂූන් වහන්සේලා ද?
(1) ධර්ම ප්‍රචාරක කටයුතුවලට සම්බන්ධ වූ අය
(2) රෝගී වූ අයට උවටැන් කරන අය
(3) නායක ස්වාමීන් වහන්සේ යටතේ වැඩ සිටින අය
(4) ආරාමවල භාවනායෝගීව වැඩ විසූ අය

18. පහත 'අ' හා 'ආ' තීරුවල දැක්වෙන වගන්ති සුදුසුපරිදි ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. පසවන්තිනාම ශාලා | A රෝහල් |
| 2. පණ්ණසාලා | B බ්‍රාහ්මණයන් ආගමික කටයුතු කළ ස්ථාන |
| 3. සොත්ති සාලා | C පන්සල් |
| 4. වෙජ්ජ සාලා | D මාතෘ නිවාස |

(1) BACD (2) DACB (3) CDAB (4) DCBA

19. පොළොන්නරුවේ දළදා මාලිගාවේ ආරක්ෂාව සඳහා වේලෙක්කාර හමුදාවක් පත්කළ රජතුමා වන්නේ,
(1) I විජයබාහු රජතුමා
(2) I පරාක්‍රමබාහු රජතුමා
(3) නිශ්ශංකමල්ල රජතුමා
(4) II පරාක්‍රමබාහු රජතුමා

20. වැවක අංග කිහිපයක් 'අ' තීරුවේ ඇති අතර ඒවායින් ඉටුවන කාර්යයන් 'ආ' තීරුවේ දක්වා ඇත. සුදුසු පරිදි ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. පිටවාන | A වැව් ජලය කෙත්බිම්වලට මුදාහැරීම |
| 2. සොරොව්ව | B වැව් බැම්ම ඇතුල්පැත්ත ඛාදනය වීම වැළැක්වීම |
| 3. බිසෝකොටුව | C වැවේ අතිරික්ත ජලය මුදාහැරීම |
| 4. රළපනාව | D වැව් ජලය මුදාහැරීමේදී අවම පීඩන තත්වයක් යටතේ පිටතට මුදාහැරීම |

(1) CABD (2) CADB (3) ACDB (4) BCDA

21. ගමේ සැඟවී සිටින අපරාධකරුවකු අල්ලා දෙනතුරු ගම්වාසීන් විසින් රාජ්‍යයට ගෙවිය යුතු බද්ද හැඳින්වූයේ කුමන නමකින් ද?
(1) කැති අඬ (2) දකපති (3) මතරමජබක (4) ගෘහදණ්ඩ

22. පුනරුද සමයේ දේශගවේෂණ කටයුතු හා සම්බන්ධ තොරතුරු කිහිපයක් 'අ' හා 'ආ' තීරුවල දක්වා ඇත. සුදුසු පරිදි ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. වස්කෝද ගාමා | A අප්‍රිකාවේ දකුණු තුඩුවට පැමිණීම |
| 2. ක්‍රිස්ටෝපර් කොලොම්බස් | B ලෝවටා යාත්‍රා කිරීම |
| 3. පර්ඩිනන්ඩ් මැගලන් | C ඇමරිකාව සොයාගැනීම |
| 4. බර්තොලමියු දියෙස් | D පෙරදිගට පැමිණි පළමු යාත්‍රිකයා වීම |

(1) DBAC (2) DACB (3) DCBA (4) BCDA

23. කාර්මික විප්ලවය ආරම්භ වූ යුරෝපා රට වන්නේ,
(1) එංගලන්තය (2) ප්‍රංශය (3) ඉතාලිය (4) ජර්මනිය

24. ක්‍රි.ව. 1623 දී ලන්දේසීන් විසින් පහරදී අල්ලාගත් කුළුබඩු දිවයින ලෙස හැඳින්වූ දූපත කුමක් ද?
(1) ජාවා (2) මැඩගස්කර් (3) සුමාත්‍රා (4) ඇම්බොයිනා

25. 1815 උඩරට ගිවිසුම අත්සන් කරන සමයේ සිටි ඉංග්‍රීසි ආණ්ඩුකාරයා වන්නේ,
(1) තෝමස් මේට්ලන්ඩ් (2) රොබට් බ්‍රවුන්රිග් (3) පෙඩ්රික් නෝත් (4) ටොරින්ටන්

26. ප්‍රසිද්ධ වාද විවාද පවත්වමින් මිෂනාරි ආගමික ප්‍රචාරක කටයුතුවලට පෙරමුණ ගත් භික්ෂූන් වහන්සේ නමකි
(1) වස්කඩුවේ සුභූති හිමි (2) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
(3) හික්කඩුවේ සුමංගල හිමි (4) රත්මලානේ ධම්මාලෝක හිමි

27. අතීත වාස්තු විද්‍යාත්මක නිර්මාණවල විශිෂ්ටත්වය නූතන තාක්ෂණික ශිල්පීය ක්‍රමවලට නොදෙවෙනි බව ප්‍රකට කරන නිර්මාණයකට නිදසුනකි,
(1) රුවන්වැලි මහසෑ නිර්මාණය (2) සීගිරි උද්‍යාන නිර්මාණය
(3) පරාක්‍රම සමුද්‍රයේ වැව් බැම්ම නිර්මාණය (4) අනුරාධපුර නගර නිර්මාණය

28. කෝට්ටේ යුගයේ ලංකාවට පැමිණි විදේශිකයකුට පහත සඳහන් සිදුවීම් අතරින් අසන්නට නොලැබෙන සිදුවීම කුමක් ද?
(1) නිශ්ශංකලතා මණ්ඩපය ඉදිකිරීම.
(2) චන්ද්‍රභානු දෙවනවරටත් ලංකාව ආක්‍රමණය කිරීම.
(3) ශ්‍රී දළදා මාළිගාවට පත්තිරිප්පුව එකතු කිරීම.
(4) ඉබන් බතූතා නම් අරාබි සංචාරකයා ලක්දිවට පැමිණීම.

29. "අනේ කුහුඹියනේ - තොපටත් රජෙක් ඉන්නේ......" යනුවෙන් ආරම්භවන කවි වලින් කියැවෙන්නේ,
(1) රජෙකුගේ අවශ්‍යතාවයක් නැති බවයි. (2) කුහුඹුවන්ටත් රජෙක් සිටින බවයි.
(3) රජෙක් නැතිවීම නිසා ඇතිවූ සිත්තැවුලයි. (4) පෙරහැර කළ හැකි බවයි.

30. රජවරු තම අභිෂේක උත්සවවලදී සෞභාග්‍යය උදාකරනු ඇතැයි යන විශ්වාසයෙන් පංච කකුධ භාණ්ඩ පරිහරණය කරන්නට ඇතැයි සැලකේ. පහත ලැයිස්තුවෙන් ඒවා ඇතුළත් පිළිතුර තෝරන්න.

| | | | |
|---|---|---|---|
| A වල්විදුනාව | B මිරිවැඩි සඟල | C පා පුටුව | D කුංකුම |
| E මඟුල් කඩුව | F සේසත | G සඳුන් අරටු | H නළල් පටිය |

(1) ABEFH (2) ABCDF (3) ACDGH (4) BCDGH

31. පැරකුම්බා සිරිත, ලෝවැඩ සඟරාව, ගුත්තිල කාව්‍ය වැනි සාහිත්‍ය ග්‍රන්ථ බිහිවූයේ කුමන යුගයේදී ද?
(1) අනුරාධපුර (2) කෝට්ටේ (3) මහනුවර (4) දඹදෙනිය

32. වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ තනතුර පිරිනමා බෞද්ධ ප්‍රබෝධයක් ඇතිකිරීමට කටයුතු කළ රජතුමා වන්නේ,

(1) ශ්‍රී විජය රාජසිංහ (2) රාජාධිරාජසිංහ (3) කීර්ති ශ්‍රී රාජසිංහ (4) ශ්‍රී වික්‍රම රාජසිංහ

33. රජ තනතුරේ ගාම්භීරත්වය රැකගනිමින් රජවාසල කටයුතු පවත්වාගෙනයාමේ කාර්යය පැවරී තිබුණේ කුමන නිලධාරීන්ට ද?

(1) මහවාසල නිලධාරීන් (2) මුහම්දිරම්වරු (3) දිසාවේවරු (4) අධිකාරම්වරු

34. කුරුණෑගල සමයේ සිදුවූ වැදගත් සාහිත්‍ය සේවාවකි

(1) කව්සිළුමිණ රචනා කිරීම.

(2) පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීම.

(3) ගිරා, සැළලිහිණි සංදේශ කාව්‍ය රචනා කිරීම.

(4) මයූර, තිසර සංදේශ කාව්‍ය රචනා කිරීම.

35. ජය ගඟ හෙවත් යෝධ ඇළ විශිෂ්ඨ වාරි නිර්මාණයක් ලෙස සැලකීමට හේතුව මින් කුමක් ද?

(1) කුඩා වැව් රාශියකට ජලය ලබාදීම.

(2) ජලය ගෙනයාමට දිගු ඇළක් නිර්මාණය කිරීම.

(3) භූමියේ ඇති සියුම් බෑස්මට අනුව ඇළ නිර්මාණය කිරීම.

(4) කලා වැවේ සිට තිසා වැවට ජලය ගෙනයාම.

36. යුරෝපයේ කාර්මික විප්ලව සමයේ නව නිපැයුම් හා ඒ හා සම්බන්ධ පුද්ගලයන් 'අ' හා 'ආ' තීරුවල දක්වේ. සුදුසු පරිදි ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' | | 'ආ' |
|---|---|---|
| 1. අශ්වයන් යෙදූ නඟුල්වලින් පේළියට වැපිරීම | A | සැමුවෙල් මෝස් |
| 2. බැටලු වර්ග අභිජනනය | B | රිචඩ් ආක්රයිට් |
| 3. විදුලි පණිවුඩ ක්‍රමය | C | රොබට් බැක්වෙල් |
| 4. ජල බලයෙන් ක්‍රියාකරන නූල් කටින යන්ත්‍රය | D | ජෙත් රෝටල් |

(1) DBCA (2) ACDB (3) BDAC (4) DCAB

37. මුදල් ආයෝජනය කරන ධනපති පංතියක් හා ශ්‍රමය විකුණන කම්කරු පංතියක් ලෙස සමාජ ස්ථර දෙකක් බිහිවූයේ,

(1) කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙසය. (2) පුනරුදයේ ප්‍රතිඵලයක් ලෙසය.

(3) දේශගවේෂණයේ ප්‍රතිඵලයක් ලෙසය. (4) යටත්විජිත ඇතිකර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙසය.

38. අතීත ශ්‍රී ලංකාවේ දියුණු වෛද්‍ය තාක්ෂණයක් පැවැති බවට හොඳම සාධකයකි

(1) වෛදවරු ලෙස ප්‍රසිද්ධ රජවරු අතීතයේදී සිටි බවට සාධක ලැබීම.

(2) පැරණි වෙද පොත් භාවිතයේ පැවතීම.

(3) පැරණි රෝහල්වලට අයත් නටබුන් හමුවීම.

(4) පුරාවිද්‍යාත්මක කැණීම්වලින් ශල්‍ය වෛද්‍ය උපකරණ හමුවීම.

39. උඩරට ගිවිසුමේ පස්වන වගන්තිය හා සම්බන්ධ පහත කරුණු අතරින් කුමන කරුණ ද?

(1) රජුගේ හතරවරිග නෑයන්ට උඩරටට ඇතුළුවීමට නොහැකිය.

(2) උඩරට රාජධානිය ඉංග්‍රීසීන්ට අයත්වේ.

(3) බුද්ධ ශාසනය හා දේවාගම කඩනොකොට ආරක්ෂා කිරීම.

(4) උඩරට මුලාදෑනින්ගේ තනතුරු හා රාජකාරි පෙර පරිදිම සිදුවේ.

40. දිගුකාලීනව මිනිසාට ප්‍රබල තර්ජනයක් එල්ල කරන කාර්මික විප්ලවයේ අහිතකර ප්‍රතිඵලයක් වන්නේ මින් කුමක් ද?

(1) සමාජ පන්ති ඇතිවීම (2) වෘත්තීය සමිති ක්‍රියාමාර්ග

(3) පරිසර දූෂණය (4) වැඩ වර්ජන සඳහා යොමුවීම

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Department of Education, Southern Province**

Department of Education, Southern Province Department of Education, Southern Province Department of Educ

**පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු**
**First Term Test, March 2019**

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය<br>Grade 11 | ඉතිහාසය - II | පැය දෙකයි<br>Two hours |

සැලකිය යුතුයි.

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ඕනෑම ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
  III කොටසින් එක් ප්‍රශ්නයකට පිළිතුරු සපයන්න.

---

## I - කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.


(i) මල්වතුඔය, පරාක්‍රම සමුද්‍රය, පාහියන්ගල, දේවනගර, සෙංකඩගල, බුන්දල, ශ්‍රී ජයවර්ධනපුරය, මහාතිත්ථ, කසාතොට, කලාවැව, දඹකොළ පටුන, කප්පකන්දර නදිය (ලකුණු 12)

(ii) කොන්ස්තන්තිනෝපල්, පෘතුගාලය, මහා බ්‍රිතාන්‍යය, සුභපැත්මේ තුඩුව, ගෝව, චීනය (ලකුණු 06)

(ආ) (i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A ලම්බකර්ණ වංශයේ ආරම්භක පාලකයා
B I විජයබාහු රජතුමාට රජවීමට ප්‍රථම රැකවරණය සැලසූ පුද්ගලයා
C ඉංග්‍රීසින් මෙරටට පැමිණෙන විට මෙහි සිටි ලන්දේසි ආණ්ඩුකාරයා
D ගාල්ලේ ත්‍රිභාෂා සෙල්ලිපිය කරවූ චීන සෙනවියා (ලකුණු 04)

- A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ දක්වන්න.



A

(ii) 1. A අක්ෂරයෙන් දක්වා ඇති පින්තූරය හඳුන්වන නම කුමක් ද?
2. මෙය සොයාගෙන ඇත්තේ කුමන ස්ථානයෙන් ද?
3. මෙය අයත්වන්නේ කුමන කාලවකවානුවකට ද?
4. මෙමගින් පිළිබිඹුවන එක් කරුණක් සඳහන් කරන්න. (ලකුණු 04)



B

(iii) 1. B රූපයෙන් දැක්වෙන පුද්ගලයාගේ නම කුමක් ද?
2. ප්‍රංශය තම රට ආක්‍රමණය කළ විට ඔහු පලාගියේ කුමන රටටද?
3. මොහු අත්සන් තැබූ ලිපිය හඳුන්වන්නේ කුමන නමින් ද?
4. එම ලිපිය නිසා ඇතිවූ ප්‍රතිඵලය කුමක් ද? (ලකුණු 04)

## II - කොටස

(02) (i) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳව සාධක හමුවූ ලෙන් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පූර්ව ඓතිහාසික යුගය ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන්කර ගැනීමට පදනම් වූ සාධක දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) (a) පැරණි ගම්වල ජීවත්වූ ගම් ප්‍රධානීන් හැඳින්වූ නම කුමක් ද?

(b) වැව් පද්ධතියකට අයත් ගම් සියල්ල නියෝජනය කළ නායකයා හැඳින්වූ නම කුමක් ද?

(c) 'a' හි දැක්වූ ගම් ප්‍රධානීන් විසින් ඉටුකළ කාර්යයන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 06)

(03) (i) පහත සඳහන් වැව් ඉදිකළ රජතුමා කවුරුන්දැයි වරහන් තුළින් තෝරා A, B, C අනුපිළිවෙලින් සඳහන් කරන්න.

A අභය වැව

B කලාවැව

C මින්නේරිය වැව

(දේවානම් පියතිස්ස රජතුමා / පණ්ඩුකාභය රජතුමා / ධාතුසේන රජතුමා / I අග්බෝ රජතුමා / මහසෙන් රජතුමා) (ලකුණු 03)

(ii) හේන් වගා කිරීම වෙනුවෙන් පැරණි රජවරු අයකළ බදු වර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) අතීත සමාජයේ දේශීය වෙළඳාම මෙන්ම විදේශීය වෙළඳාම ද පැවැති බව සඳහන් වේ. මේ බව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) දුටුගැමුණු රජතුමා මෙරට දේශපාලන බලය නිසි අයුරින් සංවිධානය කිරීමට වැදගත් සේවාවක් කළ රජ කෙනෙකි. කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

04 (i) වර්තමානයේ භාවිතාවන මිනුම් ක්‍රමවලට නොදෙවෙනි ඉතා කුඩා ඒකක පවා මැනිය හැකි මිනුම් ක්‍රම අතීතයේදී ද තිබූ බවට සාධක ඇත. පහත A, B හා C වලින් දක්වා ඇති මිනුම් භාවිතා කළේ කුමන දේවල් මැනීමටදැයි A B C අනුපිළිවෙලින් සඳහන් කරන්න.

A පරමාණු හා ආංගුල

B ගුන්ජා හා ස්වර්ණ

C කුරුණි හා අමුණු (ලකුණු 03)

(ii) යහපත් සමාජයක් පවත්වාගෙන යාමට විවිධ නීති අතීතයේදී ද පනවා ඇත. පහත සඳහන් නීති අනාවරණය වන සෙල්ලිපිය වරහන් තුළින් තෝරා A, B, C හා D අනුපිළිවෙලින් සඳහන් කරන්න.

A නිසි කලට සී සෑම නොකරන පුද්ගලයන්ට කලං පහක දඩයක් නියම කිරීම.

B සැකසූ මඩුවල පමණක් තබා බුලත් පුවක් වෙළඳාම් කළ යුතුයි.

C එළ හරකුන්, එළුවන් ඝාතනය කරන අයට මරණ දඬුවම.

D සොරකම හා මිනිමැරීම සඳහා දඬුවම එල්ලා මැරීමයි.

(වෙස්සගිරිය සෙල්ලිපිය / හෝපිටිගමුව සෙල්ලිපිය / සිතුල්පව්ව සෙල්ලිපිය / වේවැල්කැටිය සෙල්ලිපිය / මිහින්තලා පුවරු ලිපිය / කොණ්ඩවට්ටවාන් සෙල්ලිපිය) (ලකුණු 04)

(iii) (a) අතීත වාස්තු විද්‍යාවේ විශිෂ්ඨත්වය විදහා පාන අංශ දෙකක් නම් කරන්න.

(b) "සනීපාරක්ෂාව, ස්වස්ථතාව හා වෛද්‍ය ක්‍රම පිළිබඳ දීර්ඝ ඉතිහාසය, වර්තමානයට ද ආදර්ශ සපයයි." මෙය සනාථ කිරීමට කරුණු තුනක් දක්වන්න. (ලකුණු 05)

(iv) අතීත සමාජයේද කාන්තා නියෝජනය සඳහා අවස්ථා සම්පාදනය වී තිබූ බව සාධක තුනක් ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 06)

05 (i) A පළමු නාගරීකරණයට අයත් ප්‍රථම අගනගරය ද,

B දෙවන නාගරීකරණයට අයත් පාලන මධ්‍යස්ථාන දෙකක්ද දක්වන්න. (ලකුණු 03)

(ii) පළමු නාගරීකරණයට අයත් දෙවන පාලන මධ්‍යස්ථානය බිඳ වැටීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) "දෙවන පරාක්‍රමබාහු රජතුමා ශ්‍රේෂ්ඨ පාලකයකු ලෙස හැඳින්විය හැකිය." කරුණු දෙකක් ඉදිරිපත් කරමින් මෙම කියමන සනාථ කරන්න. (ලකුණු 05)

(iv) "හයවන පරාක්‍රමබාහු රජතුමා ලංකා ඉතිහාසයේ ඉතා වැදගත් සේවාවන් රැසක් සිදුකළ නරපතියෙකි." රටේ ඒකීය භාවය සුරක්ෂිත කිරීම සඳහා එතුමා ගත් ක්‍රියාමාර්ග තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

06 (i) අපේ රටේ පාලන කටයුතු සඳහා බලය අල්ලා ගැනීමට මෙරටට පැමිණි බටහිර ජාතීන් පැමිණි අනුපිළිවෙළ අනුව සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් සටන් සම්බන්ධයෙන් ක්‍රියාකළ පෘතුගීසි කපිතාන්වරුන්ගේ නම් වරහන් තුළින් තෝරා A, B, C හා D අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A දන්තුරේ සටන

B බලන සටන

C රන්දෙනිවල සටන

D ගන්නොරුවේ සටන

(දියෝගෝද මේලෝ / කොන්ස්තන්තීනු ද සා / අපොන්සු පෙරේයිරා ලසර්දා / දොන් ජෙරනිමෝ ද අසවේදු / පේරෝ ලෝපැස් ද සූසා) (ලකුණු 04)

(iii) "නව රාජවංශයක් ආරම්භ කරමින් රාජ්‍යත්වයට පත්වූ I විමලධර්මසූරිය රජතුමාට අභියෝග රැසකට මුහුණ දීමට සිදුවිය. එතුමා ඒවා ජය ගැනීමට ද ක්‍රියා කළේය."

(a) එතුමා මුහුණ දුන් එක් අභියෝගයක් හා

(b) අභියෝග ජය ගැනීමට ගත් ක්‍රියාමාර්ගයක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) (a) මහනුවර රාජධානියේ රජතුමා විසින්ම විසඳූ නඩු වර්ග තුනක් හා

(b) මහනුවර රාජධානි සමයේ සමාජ සංවිධානයේ කැපී පෙනෙන ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 06)

07 (i) ඉංග්‍රීසීන් මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කර ගැනීමට පෙර ඔවුන්ගේ දූතයන් තිදෙනෙකු වරින් වර උඩරටට පැමිණ තිබේ. එම තිදෙනා නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත A, B, C හා D යන සිදුවීම් හා සම්බන්ධ පුද්ගලයන් අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් ලංකාවට පත්කර එවූ ප්‍රථම ආණ්ඩුකාරයා කවුද?

B උඩරට තොරතුරු රහසිගතව ලබාගනිමින් උඩරට භික්ෂූන්වහන්සේලා හා ප්‍රභූන්ගේද සිත් දිනාගත් ඉංග්‍රිසි රාජ්‍ය නිලධාරියා කවුද?

C ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සමග මතභේද ඇතිකරගත් බැවින් මරණීය දණ්ඩනයට ලක්වූ මහාධිකාරම්වරයා කවුද?

D උඩරට ගිවිසුම අත්සන් කිරීමට ආසන්න මොහොතේ එසවූ ඉංග්‍රීසි කොඩිය බිම හෙළා සිංහ කොඩිය එසවූයේ කවුද? (ලකුණු 04)

(iii) 1797 ඉංග්‍රිසි වෙළඳ සමාගමේ පාලනයට එරෙහිව මුහුදුබඩ ප්‍රදේශවල ජනතාවගේ අප්‍රසාදය කැරැල්ලක් බවට පත්විය."

(අ) එවැනි කැරැල්ලක් ඇතිවීමට හේතු වූ කරුණු තුනක් හා

(ආ) කැරැල්ල මැඩලීමෙන් පසු පත්කළ මියුරන් කොමිසමේ නිර්දේශ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 05)

(iv) "උඩරට ගිවිසුම අත්සන් කර වසර තිස් තුනක් ගතවීමෙන් පසුද උඩරටියන්ට හුරුපුරුදු වූ පැරණි රාජාණ්ඩු ක්‍රමය යළි ස්ථාපිත කරගැනීමට ආයුධ සන්නද්ධ අරගලයකට අවතිර්ණ විය."

(a) එම නිදහස් අරගලයට නායකත්වය දුන් පුද්ගලයන් දෙදෙනෙක්

(b) එම අරගලයට හේතු වූ කරුණු දෙකක් හා

(c) එය අසාර්ථක වීමට හේතු දෙකක් ද සඳහන් කරන්න. (ලකුණු 06)

---

## III - කොටස

(08) (i) පුනරුද සමයේ පහත සොයාගැනීම් කළ පුද්ගලයන් නම් කරන්න.

A දුරේක්ෂය

B මුද්‍රණ යන්ත්‍රය

C ගුරුත්වාකර්ෂණ නියමය (ලකුණු 03)

(ii) පහත කරුණු හා සම්බන්ධ පුද්ගලයන් වරහන් තුළින් තෝරා A, B, C හා D අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A කතෝලික සභාවේ දුර්වලතා විවේචනය කිරීම.

B "අන්තිම රාත්‍රී භෝජන සංග්‍රහය" චිත්‍රය නිර්මාණය කිරීම.

C කිරිගරුඬින් ප්‍රතිමා නෙළීම.

D සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක ඉලිප්සාකාර ගමන් මාර්ගයක පරිභ්‍රමණය වීම.

(ජොහැන්නස් කෙප්ලර් / නිකලස් කොපර්නිකස් / මයිකල් ආන්ජිලෝ / මාටින් ලූතර් / ලියනාඩෝ ඩාවින්චි / මයිකල් සර්වෙටස්) (ලකුණු 04)

(iii) (a) දේශ ගවේෂණ කටයුතු සඳහා මුලින්ම උනන්දුවක් දක්වූ රටවල් දෙක හා

(b) පුනරුදයේ බලපෑම නිසා අපේ රටේ ආර්ථික අංශයේ ඇතිවූ වෙනස්කම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 05)

(iv) "පුනරුද සමයේ සොයාගැනීම් නව මුහුදු මාර්ග සොයා යාමේ ගමන සාර්ථක වීමට හේතු විය." නිදසුන් තුනක් ඇසුරින් සනාථ කරන්න. (ලකුණු 06)

09 (i) බ්‍රිතාන්‍යයට අමතරව කාර්මික විප්ලවය ව්‍යාප්ත වූ යුරෝපා රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත නම් සඳහන් පුද්ගලයන් සිදුකළ සොයාගැනීම් A, B, C හා D අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A සැමුවෙල් ක්‍රොම්ප්ටන්

B හෙන්රි බෙසමර්


C හම්ප්‍රිඩේවි

D ගුග්ලි එල්මෝ මාර්කෝනි (ලකුණු 04)

(iii) කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයේම ආරම්භවීමට හේතු වූ කරුණු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) කාර්මික විප්ලවය කෘෂිකාර්මික ක්ෂේත්‍රය කෙරෙහි ඇතිකළ බලපෑම කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 04)

(01) (අ) (i) ප්‍රශ්නයට අදාළ ශ්‍රී ලංකා සිතියම



(01) (අ) (ii) ප්‍රශ්නයට අදාළ ලෝක සිතියම

